## සැලැස්මට සම්බන්ධ අනෙකුත් තොරතුරු

- ඇතුලත්වීමේ වයස අවු 18 - 65 දක්වා කල්පිරීමේ වයස අවු 70 නොඉක්මවිය යුතුය.
- සැලසුම් කාලසීමාව අවු 5 - 40.
- අවම වාර්ෂික මූලික වාරිකය රු 6000.
- අවම තනි වාරිකය රු 15000.

## සැලසුම බල රහිත වුවහොත් සිදුවන්නේ කුමක්ද ?

පළමු වසර 3 ඇතුලත ඔබ විසින් ඔබගේ වාරික දින 30 ක සහන කාල සීමාව තුල නියමිත පරිදි ගෙවනු නොලැබු විටක දී සැලසුම බල රහිත වන අතර ඔබ වෙත ප්‍රතිලාභයක් හිමි නොවනු ඇත. කෙසේ වුවද කොන්දේසි වලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමිවේ.

ඔබ විසින් වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් වාරික නිසිපරිදි ගෙවමින් සැලසුම පවත්වා ගෙනගොස් ඇත්නම් අත්‍යවශ්‍ය අවස්ථාවක දී සැලසුම මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ඔබට හිමිවේ. කෙසේ වුවද සැලසුම සැලකියයුතු පවාරණ ගාස්තුවකට යටත්වන අතර එම ගාස්තුව සැලසුම පවත්වාගෙන ගොස් ඇති කාල සීමාව අනුව වෙනස් වේ. විකල්පයක් වශයෙන් ජීවිතාවරණ ප්‍රතිලාභ රහිතව ඔබේ අරමුදල වර්ධනය වීමට ඉඩහරිමින් කල්පිරීමේ වැඩි වටිනාකමක් ලබා ගැනිමට ද ඔබට හැකි වේ.

076 50 20 300
011 200 2021

සණස Life
சணச லைஃப் இன்ஷூரன்ஸ்
SANASA LIFE INSURANCE

340 2/1, ආර් . ඒ . ද මෙල් මාවත , කොළඹ 03

# සණස ආයෝජන
## රන් දියණි



සණස Life
சணச லைஃப் இன்ஷூரன்ஸ்
SANASA LIFE INSURANCE

දියණිය නිවසට පහනක් මෙනි. ඒ ඇය නිවසට ආලෝකයක් වන නිසාය. ඒ අයුරින්ම ඇයගේ ජීවිතය ආලෝකමත් වනු දැකීම සෑම දෙමාපියෙකුගේම බලාපොරොත්තුවයි. සැමදා ඇය සතුටින් සිටිනු දැකීම සෑම දෙමාපියෙකුගේම බලාපොරොත්තුවයි. රන් මෙන් වටිනා ඇය රනින් සරසා ගෞරවාන්විත විවාහ කරදීම දෙමව්පියන්ගේ බලාපොරොත්තුවයි, සිහිනයයි, වගකීමයි. සණස ආයෝජන ඊට ඇති හොඳම සැළසුමයි.

## සණස ජීවිත ආයෝජන සැලැස්මේ ඇති විශේෂත්වයන්

කල්පිරීමේ දී බදු වලින් නිදහස් ඉතුරුම් අරමුදලක්.

ඔබටම ගැලපෙන ජීවිත ආවරණයක්.

ඔබ නැතත් ඔබගේ පවුලේ මාසික ආදායම සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබේ ඉතුරුම් උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබ ඔබගේ කලත්‍රයා හා ඔබගෙ දරුවන් සුරක්ෂිත කිරීම සඳහා අතිරේක ප්‍රතිලාභ රැසක්.

අමතර සෞඛ්‍ය සහ රැකවරණ ප්‍රතිලාභයන් මඟින් රෝහල් ගතවීම්, බරපතල රෝගාබාධ සහ සැත්කම් ද ආවරණය වේ.

# සණස ආයෝජන රන් දියණි

## ඔබගේ දරුවාගේ දෑවැද්ද සඳහා අරමුදල ගොඩනැගෙන ආකාරය

උදාහරණයක් ලෙස, මේ වර්ෂයේදී ඔබගේ වයස අවු 30ක් ලෙසද, දරුවගේ වයස අවු 5ක් ලෙසද, දරුවාට වයස අවු 25දී දෑවැද්ද ලබා දීමට මසකට රු.3000ක හෝ රු.5000ක මුදලක් වෙන් කරන්නේ යැයි උපකල්පනය කරමු. එවිට ඔබගේ දරුවා වෙනුවෙන්,

| මාසික වාරිකය | ප්‍රක්ශේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | 6% වාර්ෂික | 8% වාර්ෂික | 10% වාර්ෂික |
| 3 000 | 1 111 542 | 1 372 433 | 1 703 833 |
| 5 000 | 1 860 841 | 2 297 367 | 2 851 859 |

ශ්‍රී.ල.රු.

ඉහත ප්‍රක්ෂේපිත වටිනාකම් හුදෙක් නිදර්ශනයක් වන බව සලකන්න. මෙහි දක්වා ඇති ඉපැයීම් අනුපාතයන් වාර්ෂිකව වෙනස් වේ. එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහලම හෝ පහළම අනුපාතයන් නොවේ. කල්පිරීමෙදී ඔබට ලැබෙනුයේ ඔබේ අරමුදලේ වටිනාකම වේ.

## සණස ආයෝජන සැලැස්ම සඳහා වන අමතර ප්‍රතිලාභ

### අතිරේක ජීවිත රක්ෂණ ප්‍රතිලාභ

සුළු මුදලක් අමතරව ගෙවීමෙන් මූලික ජීවිතාවරණය වැඩිකර ගත හැකිය. මෙයින් ඔබෙ පවුලේ සුරක්ෂිතභාවය වඩාත් තහවුරුවේ.

### හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවක දී ඔබේ යැපෙන්නන් හට මෙයින් වැඩි රැකවරණයක් හිමි වේ. එයට අමතරව ඔබට පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණ මෙයින් සැලසෙනු ඇත.

### රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින 3 කට වඩා රෝහල් ගතවී සිටියේ නම් සෑම දිනකටම (ඇතුලත් කල දිනයේ සිටම) රු 10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබා දේ. දැඩිසත්කාර ඒකකයට ඇතුලත් කලහොත්, ලැබෙන එම මුදල දෙගුණවේ.

### බරපතල රෝග ආවරණය

සැලසුමේ නිර්වචනය පරිදි බරපතල රොගී අවස්ථාවකදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි.

### අවමංගල්‍යාධාර වියදම්